# අයවැය කථාව 2015

**ගරු සභාපතිතුමනි,**

**ගරු අමාත්‍යවරුනි,**

**ගරු විපක්ෂ නායකතුමනි,**

**ගරු මන්ත්‍රීතුමියනි,**

**ගරු මන්ත්‍රීතුමනි,**

## පළමු කොටස

මධ්‍යම පළාතේ හය වැනි පළාත් සභාවේ දෙවැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ මොහොතට සහභාගි වී සිටින තමුන්නාන්සේලා සියළුදෙනා ම ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමි.

'' අද දිනයේ වපුරන සියල්ල අනාගත පරපුරේ යහපැවැත්ම වෙනුවෙනි. එහෙයින් අද මෙන්ම හෙටද දේශයේ ස්ථිරසාරත්වය සහ අභිමානත්වය සුරැකෙනු නියතය''

මේ උපුටා ගැනීම මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධනාත්මක යෝජනාවලියේ දී මේ කියමන කොයිතරම් සත්‍ය හා ගැඹුරු ද යන්න මේ ගෞරවනිය සභාවේ තමුන්නාන්සේලා සියළු දෙනාගේම අවධානය පළමුව යොමු කරනවා. එවන් අදහසක් පළමුකොට මතුකිරීමට කල්පනා කළේ සමස්ත අංශයටම වඩාත් තීරණාත්මක වු අයවැයක් පසුගිය 24 වෙනිදා මුදල් අමාත්‍යවරයා ලෙස ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා.

එම අයවැය සමානාත්මතාවය, අවකාශය, ධෛර්ය, ස්වාභිමානය එක්කල ප්‍රකාශයක්. ජාතියම ඔසවා තබමින් ශක්තිමත් ආර්ථික වැඩපිළිවෙලක් තුළ හඩ මහ බලවේගය සමඟ නොනැවතී පෙරටම යන ගමනක් තවදුරටත් ශක්ති සම්පන්න කළ අයවැය ප්‍රකාශනයක්. එවන් ප්‍රකාශයක්

ජාතිය හමුවේ තැබූ එතුමන්ට පළමුව මැද රට ජනතාවගේ නියෝජිතයන් වන තමුන්නාන්සේලා සියලුදෙනා වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තූතිය පළකර සිටිනවා.

මේ අප ප්‍රවේශව සිටිනුයේ රටේත්, ජාතියේත්, වඩාත් තීරණාත්මක අවධියකටය. රටේ රාජ්‍ය නායකයා ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ දෙවන ධූර කාලයේ සිව්වන වසර සපිරීමට ඇත්තේ තවත් දින කිහිපයක් පමණි. එතුමාගේ මෙම ධූර කාලයම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අභියෝග වලින් පිරි යුගයක් බව අපට අමතකව නැත. යුද්ධය අතිශය උත්සන්නම අවස්ථාව, එළඹ තිබුණු අවධියක ඒ සඳහා නිවැරදි නායකත්වයක් හා සෘජු තීරණ තීන්දු අපේක්ෂාවෙන් රට ජාතිය බේරා ගැනීම දැඩි අවශ්‍යතාවයෙන් යුධ හමුදාව ප්‍රධාන වූ සියලු ආරක්ෂක බල මුලුවලට නව ජවයක්, බලයක්, ජීවයක් දෙමින් කෙටි කාළයක් තුළ ලෝකයේ භායනකම ත්‍රස්තවාදී සංවිධානය හා ඒ නායකයාද විනාශයට පත් කොට, දේශයට දෙවන නිදහස දීමට එතුමාගේ යුධ නායකත්වයට හැකි වුණා. යුධ ජයග්‍රහණය තෙක් සමය මුදල් වෙන් කිරීමේ දී ප්‍රමුඛතාවය ලැබුණේ හමුදා අවශ්‍යතා වෙනුවෙන් විජයග්‍රහණයෙන් පසු සමය යුද්ධයෙන් විනාශ වූ ජනතාවගේ ජීවන තත්වය යථාතත්වයට පත් කරන්න වගේම විනාශ වූ ගම්බිම්, නගර ගොඩනගන්න විශාල බරක් දෙන්න වුණා. වසරින් වසර, මේ උතුරු නැගෙනහිර සංවර්ධනයට සමගාමීව මේ රටේ සෑම දිශාවකම විශාල සංවර්ධනාත්මක ව්‍යාපෘති ආරම්භ කිරීමට මුල පිරුවා. මධ්‍යම පළාත තුලත් ඉහළ කොත්මලේ විදුලි බලාගාරය, මොරගහකන්ද ව්‍යාපාරය, තෙල්දෙණිය ගුවන් තොටුපළ ඇතුළු ව්‍යාපෘති දෙකක් සඳහා මුල පිරුවා, නිම කළා. සාර්ථක ප්‍රතිඵල ලැබුවා, ලබනවා.

එමෙන්ම අධිවේගී මාර්ග උතුර - දකුණ යා කරමින්, ඉදිකෙරුණා. වසර 24 ක් විරසකව සිටි ''යාල්දේවිය'' යලිත් මිත්‍රශීලී ගමනකට එක් කරන්නට හැකි වුණා. ඒ වගේම ගුවන් තොටුපළ, වාරය, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා, රංග ශාලා, ක්‍රීඩාංගන, සංචාරක පුරවරයන් වගේම හෝටල්,

කර්මාන්ත, පුරවර ආදී යෝධ වැඩසටහන් ගණනාවක් මුල පුරමින් මේ සියල්ලෙහි ප්‍රතිලාභ ජාතියටම ලබා දෙන්නට මුල පුරනු ලැබුවා. එහි තවත් යෝධ පියවරක් ලබන 14 - 15 දෙදින තබනවා. ඒ උතුරු අධිවේගී මාර්ගයේ මුල් පියවරේ ඉදිකිරීම් ආරම්භ කිරීම. එහි ප්‍රතිඵලය ලබන්නේ කන්ද උඩරට ජනතාවයි.

මාගම් රුහුණු පුරය පමණක් නොව නැගෙනහිර, උතුර, වයඹ, මධ්‍යම, සබරගමුව ආදී හැම පළාතක්ම නොසිතූ කවුරුත් විශ්වාස නොකළ අපේක්ෂා නොකළ වේගවත් සංවර්ධනාත්මක ගමන් මඟකට යොමු කරනු ලැබුවා. ශ්‍රී ලංකාව රටක් ලෙස සිය සංවර්ධනය ස්ථාවරව පවත්වා ගනිමින්, යහපැවැත්ම ඉහළ නැංවීමට කටයුතු කරනු ලැබුවා. ඇමරිකානු ඩොලර් 3800 ක් කරා ඉහළ යමින් පවතින ඒක පුද්ගල ආදායමක් සමඟ ජනතාවට ආදායම් අතින් පමණක් නොවෙයි, හරිත පරිසරයක්, හිතකර ගෞරවනීය වටපිටාවක්, විශිෂ්ඨ සෞඛ්‍ය සේවාවන්වලට පහසු පිවිසුමක් මෙන්ම පිරිසිදු ජලය හා විදුලිය ආදියෙන් පිරිපුන් උසස් දිවිපැවැත්මක් හිමි කර දීමට පියවර රැසක් ගනු ලැබුවා. සාරධර්ම ආරක්ෂා කරමින් සංස්කෘතික හා ඓතිහාසික උරුමයන් සුරැකීමටත්, වැඩිහිටියන්ට ගරු කරන, අබාධිත පුද්ගලයන් සමාජයේම කොටසක් ලෙස පිළිගන්නා සුරැකි සමාජයක් සඳහා පසුතලය සකස් කරනු ලැබුවා. රටේත්, ජනතාවගේත් සංතෘප්තිය දැවැන්ත ආශිර්වාදාත්මක බලවේගයක්. මෙය නොඅඩුව ලබමින් ඉලක්ක ඒක පුද්ගල ආදායමේ සංවර්ධනාත්මක අගය ඇමරිකානු ඩොලර් 8500 ක්. ඒ කරා ජාතිය ඔසවා තබන ගමන තව තවත් ශක්තිමත් කළ පියවරක් ලෙස 2015 වේ අයවැය අපට අර්ථකථනය කල හැකී. මෙහි ප්‍රතිලාභය විශේෂයෙන් පළාත් සභාවක් ලෙස අපට වැදගත්වනවාසේම, පළාත් කාර්ය භාර්යට උරදෙන පරිපාලන සේවා නිලධාරියාගේ පටන් සියලු වෘත්තීන්හි යෙදෙන්නන්ටත්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ටත්, භුක්ති විදීමේ අවකාශය ලැබී ඇත්තා සේම වෙනත් අයවැය ප්‍රකාශන වලින් වෙන් නොවූ තරම් විශාල මුදලක් පළාත් සංවර්ධනාත්මක කාර්යයන් සඳහා භාවිතයට ගැනීමටද අවස්ථාව ලබා දී තිබෙනවා. මේ විශාල මුදල් සම්භාරයෙන් ඉහළ සංවර්ධනයක් අපේ

පළාත් බද ගම්මානවලට ගෙන යාමට ජනතා නියෝජිතයන් ලෙස තමුන්නාන්සේලාට ලැබීම කොතරම් සතුටට කරුණක්ද? දැන් අපේ වගකීම ක්‍රමානුකූලව එහි සැලසුම් සහගත ලෙස ජනතාව වෙත එම ප්‍රතිලාභයන් ගලා යාමට සැලැස්වීම නොවේද?

**ගරු සභාපතිතුමනි,**

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මේ වසරේ ඉදිරිපත් කළ අයවැය ප්‍රකාශයේ ඓතිහාසික බව අද මවිසින් ගෞරවනීය සභාවට ඉදිරිපත් කරන මේ අයවැය ප්‍රකාශයටද අභිර්වාදයක් බව කිවයුතුද වනවා. මීට වසර 15 කට පෙරාතුව ආරම්භ වූ මාගේ දේශපාලන ගමන් මගේ මෙවන් සංදිස්ථානයකට මා ද පැමිණ ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. මධ්‍යම පළාත් සභා ඉතිහාසයේ වැඩිම කාලයක් ප්‍රධාන අමාත්‍ය ධූරය දැරීමේ භාග්‍යලත් පුද්ගලයා ලෙසින් අඛණ්ඩව අයවැය ප්‍රකාශ 10 ක් සභාගත කිරීමේ භාග්‍යලත් පුද්ගලයා ලෙසද මා තුළ ඇත්තේ නිහතමානී ආඩම්බර හැගීමකි. පළාත් සභාවට ලැබෙන මුදල් නිසි ලෙසින් අමාත්‍යාංශ වෙත බෙදා දෙමින් අධ්‍යාපන, සෞඛ්‍ය, මාර්ග, කෘෂිකර්ම, කර්මාන්ත ප්‍රධානව සියලු ක්ෂේත්‍ර සඳහා නව වැඩසටහන් රාශියක් හදුන්වා දෙමින් අන් පළාත්වලට නොදෙවෙනි ලෙස පූර්වාදර්ශී ව්‍යාපෘති දියත් කිරීමට හැකි වූ බවද සඳහන් කරනුයේ සතුටු සිතිනි.

විශේෂයෙන්ම මෙවර අයවැය මෙම අභිනව සභා ගර්භය තුළදී පළාත හමුවේ තැබීමේ මුල් භාග්‍යවන්තයාද මම වෙමි. පළාත තුළ නාගරික හා ග්‍රාමීය මට්ටමේ සංවර්ධනයටත්, පරිපාලනයටත්, හැකි සියලු මට්ටමින් ව්‍යාපෘති හරහාද විශාල මුදල් සම්භාරයක් ලබා දීමට හැකි වීමත්, ඒවා නිසි ලෙසින් ජනතා මෙහෙවරට යොදවමින් ගමින් ගම නගරයෙන් නගරයටත් දොරින් දොරටත් එම ප්‍රතිලාභ ගලා යාමට ඉඩ අවස්ථා සම්පාදනය කර දීමටද හැකි බව ද ප්‍රකාශ කරමි. පසුගිය දින කිහිපය තුළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද ප්‍රකාශ කිහිපයක් යලි උපුටා දක්වමින් අයවැය ප්‍රකාශය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

''ඵලදායී සේවයක් ලබා දීම තුළින් දිවියට සවියක්'' තේමා කරගත් පළාත් පාලන සමුළුව හා ස්වර්ණපුරවර සම්මාන උළෙල.

''සංවර්ධනයේ දී ජනතා සේවයේදී දේශපාලන මතවාද ඇති විය නොහැකිය. පොදු සේවාවන් ලබා දීමට අප පියවර ගත යුතුය''

''දැන් අපට ඕනෑ ජනතාවගේ හද ගැස්ම හඳුනන ජනතාවගේ අවශ්‍යතා ගැන අවදියෙන් ඉන්න නියෝජිත පිරිසක්. මේ වන විට වෙනස් කොට මේ රටේ ජනතාවගේ වගේම ලෝකයේත් සිතුම් පැතුම් බොහෝ සෙයින් වෙනස් වෙලා. වෙනස් වෙමින් පවතිනවා. ඒ ලෝකය සමඟ අපිත් වෙනස් වෙමින් ඉදිරියට යා යුතුය''

ග්‍රාම නිලධාරින් 5000 ක් හමුවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කළ ප්‍රකාශය.

''ආබාධිත දරුවාගේ සිට විශ්‍රමිකයා දක්වාම නිවසටම ප්‍රතිලාභ අත්කර දිය හැකි අයවැයක් අපට ඉදිරිපත් කරන්න හැකි වුණේ ත්‍රස්තවාදය නිමාකර වසර 4 ක සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාව අතට පත්කරන්න හැකියි වීම නිසායි''

රාජ්‍ය සේවය ශක්තිමත් කරමින් පහසුකම් වැඩිකරන්නටත් ජනතාවට කාර්යක්ෂම සේවයක් ලබා දීමේ අරමුණෙන් තමන් වෙත කඳුළු පිරි දෙනෙතින් පැමිණෙන අසරණ ජනතාවගේ කඳුළු පිස දමා සිනා මුසු මුහුණෙන් ආපසු යැවීමේ වගකීම රාජ්‍ය සේවකයන් වන තමුන්නාන්සේලා සතුයි.

2015 අයවැය ක්‍රියාත්මක කිරීමේ දී පරිපාලන නිලධාරින්ගේ කාර්ය භාර්ය වැඩමුලුව,

''අප අයවැයෙන් ලබා දී ඇති ප්‍රතිලාභ නිසි ලෙස ජනතාව අතට පත් කළ හැක්කේ රාජ්‍ය නිලධාරින්ට මේ අයවැය ශීත කාමරවල සිට සකස් කළ එකක් නොවෙයි. එය ජනතාවට ඉතා සමීපව ජනතා අදහස් ලබා ගනිමින් සකස් කල එකක්. ඒ නිසා මෙහි සඳහන් වන්නේ ජනතාවගේ

ඉල්ලීම්. ඒවා ඉටු කරන්න පොදු ජන අවශ්‍යතා ඉටු කරන්න ඔබේ උපරිම කැපවීම අවශ්‍යවනවා''

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිපාලන නිලධාරිහු හා විදුහල්පතිවරු හමුව,

වසර 10 ක් පුරා කළ සංවර්ධනයක්, ආර්ථික කළමනාකරණයත් තුළින් ලාභ බෙදා දීමට හැකි වූ අයවැයක්. දැනුම මූලික කරගත් මේ ප්‍රතිලාභය දරුවන් අතට පත් කළ හැක්කේ දරුවන්ට නව ලෝකය පෙන්නුම් කරන තමුන්නාන්සේලා විසින්  මේ සියලු සම්පත්වල ප්‍රතිලාභයන් දරුවන්ට ලබා දීමෙන්.

මේ ප්‍රකාශයන් මම උපුටා ගත්තේ වසරින් වසර ක්‍රමානුකූලව අයවැය පරතරය අවම කර ගනිමින්, සංවර්ධනයේ ප්‍රතිලාභ උපරිම ලෙස ජනතාව අතට පත් කිරීම රාජ්‍ය නායකයාගේ ඇති සැබෑ උවමනාව පෙන්නුම් කරන්න.

මේ සියල්ල හොඳින් අධ්‍යයනය කරන ඕනෑම කෙනෙකුට තේරුම්යනවා මේ අයවැය ජනතාවට අත්තකිලමතානු හෙවත් ''දුක දෙන'' අයවැයක්ද, නැතිනම් අප විශ්වාස කරන විදිහට ජනතාවට ''සැප දෙන'' නැතිනම් කාමසුඛල්ලිකානු අයවැයක්ද කියන එක.

**ගරු සභාපතිතුමනි,**

තීන්දුව රටට භාර කොට අවසර දෙන්න මෙවර පළාත් අයවැය මේ ගෞරවණීය සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමනි,**

මධ්‍යම රජයේ ප්‍රතිපාදන හා මග නැගුම, පුර නැගුම, දිවි නැගුම, දොරින් දොරට - ගමින් ගමට, එක් ගමකට එක් වැඩක් සහ කඳුරට උදානය ආදී වැඩසටහන් රාශියක් යටතේ රුපියල් මිලියන දහස් ගණනක් අප පළාතේ ආයෝජනය කරමින් මාර්ග, පාලම්, පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු රාශියක් සෑම ගමකටම ප්‍රතිලාභ

අත්වෙන ආකාරයට මෙම වර්ෂයේදි ඉටුකර ඇති බව තමුන්නාන්සේලා හොඳින් දන්නවා ඇත. මෙම ව්‍යාපෘති වල ප්‍රතිලාභ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සෑම ජන කොටසකටම අත් වෙනවා ඇත. එපමණක් නොව අප පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ඉටුකරන ලද ආයෝජනයන් මගින්ද විවිධාකාර ප්‍රතිලාභ අත්කර දී ඇත.

**ගරු සභාපතිතුමනි,**

පසුගිය වර්ෂ කිහිපය තුළදි අප පළාත් සභාව විසින් ඉටුකරන ලද ක්‍රියාකාරකම්හි අත්කරගත් ප්‍රතිඵල කිහිපයක් ඔබ හමුවේ තැබීමට අදහස් කරමි.

මධ්‍යම පළාතේ කෘෂිකර්මාන්තය නගාසිටුවීම සඳහා ගොවීන් පුහුණු කිරීම, උපදෙස් ලබා දීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රචලිත කිරීම වැනි කටයුතු වල ප්‍රතිඵලයක් ලෙස, 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය සසදා බලන විට, විශේෂ දියුණුවක් දැකිය හැක. මෙම කාලය තුලදි බිත්තර වී නිෂ්පාදනය බුසල් 48,000 සිට බුසල් 50,000 දක්වාත්, බීජ අර්තාපල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 240 සිට 262 දක්වාත්, ලොකු ළූණු බීජ ප්‍රමාණය කි.ග්‍රෑ.15,000 සිට 17,500 දක්වාත්, බීජ බෝංචි ප්‍රමාණය කි.ග්‍රෑ. 150 සිට 200 දක්වාත් වැඩි දියුණු කර, ගොවීන්ට බෙදා හැරීමට හැකිවිය. මෙම ප්‍රමාණය 2015 වර්ෂයේදි තවත් වැඩි කිරීමට අපේක්ෂිතය. මෙමගින් ගොවීන්ගේ ආදායම සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති බවත් අපට සතුටට කරුණකි.

එමෙන්ම කිරි නිෂ්පාදනය අතින් ද මධ්‍යම පළාත ප්‍රමුඛස්ථානයක් ගෙන ඇත. 2010 දී කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 59.13 ක ප්‍රමාණය 2013 වන විට කිරි ලීටර් මිලියන 78.84 ක් දක්වා ඉහළ ගොස් ඇත. මීට හේතුව වන්නේ උසස් ආකාරයේ කිරි ගවයන් බෙදා හැරීම, උසස් වර්ගයේ තෘණ වර්ග භාවිතය හඳුන්වා දීම සහ කෘත්‍රිම සිංචන ක්‍රමය ප්‍රචලිත කිරීම ඇතුළු විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙම

ක්‍රමවේදයන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කරන අතර, දෙනුන්ගේ කිරි නිෂ්පාදකතාව වැඩි කිරීම තුලින් 2016 දී කිරි ලීටර් මිලියන 101.0 දක්වා වැඩි කර ගැනීමට අපේක්‍ෂා කෙරේ.

පළාතේ පේෂකර්ම මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට අමතරව රෙදිපිළි නිෂ්පාදනයන්හි නව නිපයුම් හඳුන්වා දීමටත් එම නිෂ්පාදනයන් හි දේශීය පරිභෝජනය වැඩි කිරීමටත් විදේශිකයන්ට අලෙවි කිරීමටත්, පහසුකම් සැපයීමටත් අපට හැකි විය.

**ගරු සභාපතිතුමනි,**

පළාතේ රැකියා විරහිත තරුණ තරුණියන්ට රැකියා ලබාගැනීම සඳහා වෘත්තීමය පුහුණුව ලබා දී ඔවුන් රැකියා ගැන්වීමටත්, ස්වයං රැකියා කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මහන මැෂින්, වඩු කාර්මික උපකරණ ආදිය සපයා ඔවුන් දිරිමත් කිරීමටත් හැකිවූ අතර මෙමගින් තරුණ තරුණියන් 4360 කට අධික ප්‍රමාණයක් සවිබල ගන්වා ඇත. එපමණක් නොව පළාතේ ආගමික සිද්ධස්ථාන, සුභසාධක සමිති, මරණාධාර සමිති ආදී සමාජ සේවා ආයතන වලට අවශ්‍ය උපකරණ හා පහසුකම් සපයා ග්‍රාමීය ජනතාවගේ සමාජීය අවශ්‍යතාද සපුරාලීමට හැකි විය.

අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් අප විසින් ඉටුකර ඇති කාර්ය භාරය ඉමහත්ය. ඒ අතරින් ගුරුවරුන් බඳවා ගෙන පුරප්පාඩු පවතින පාසල්වලට අනුයුක්ත කිරීමටත්, ගුරුවරුන්ගේ හිඟ වැටුප් ගණනය කර ඒවා ලබා දීමටත්, උසස් සේවාවක් දරුවන්ට ලබා දීම සඳහා ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, පාසල්වලට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දී පහසුකම් සැලසීමටත් හැකි විය. එමෙන්ම සෑම පාසලකටම පාහේ පරිගණක ලබා දී දරුවන්ගේ තොරතුරු තාක්‍ෂණ සාක්ෂරතාවය වැඩිකර ගැනීමට හැකිවිය. එමෙන්ම සෞඛ්‍ය සේවාව උපරිම අයුරින්

මහජනතාවට ලබා දීම සඳහා රෝහල්වලට අවශ්‍ය උපකරණ හා ගොඩනැගිලි පහසුකම් ලබා දීමටත්, බෝනොවන රෝග වළක්වා ගැනීමට මහජනතාව දැනුවත් කිරීමටත් හැකි වූ අතර, බෝවන රෝග පැතිරියාම අවම කර ගැනීම සඳහාත් අවශ්‍ය පියවරයන්ද ගනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම වසර තුළ ඩෙංගු රෝගය නිසා කිසිම මරණයක් වාර්තා වී නොමැත. එමෙන්ම තෙල්දෙණිය මූලික රෝහල ඉතා උසස් මට්ටමින් වැඩි දියුණු කිරීම පසුගිය වසරේදී ආරම්භ කළ අතර, එමගින් නගරයේ රෝහල් කරා පැමිණෙන රෝගීන් සංඛ්‍යාව අඩු වී මහජනතාවට උසස් සේවයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

**ගරු සභාපතිතුමනි,**

පළාත් සභාව සතු සී ශ්‍රේණියේ මාර්ග කි.මි.1,665.12 ක් ද, ඩී ශ්‍රේණියේ මාර්ග කි.මි.578.73 ක් ද වශයෙන් කි.මි. 2,243.85 ක් ඇත. මේවායින් ඉතා හොඳ මට්ටමේ මාර්ග කි.මි. 1,067.85, ක් ද නඩත්තු කල හැකි මට්ටමේ මාර්ග කි.මි. 518.66 ක් ද හා අබලන් තත්ත්වයේ ඇති මාර්ග කි.මි.657.34 ක් ද වේ. හොඳ තත්ත්වයේ ඇති මාර්ග කි.මි.837 ක් කාපට් අතුරා ඇති අතර තවත් කි.මි. 230.85 ක් මාර්ග මැටල් අතුරා තාර දමා සංවර්ධනය කර ඇත. ඒ අනුව තවත් කි.මි.1,176 ක ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට ඉතිරිව ඇත.

**තොරතුරු තාක්ෂණ සංවර්ධනය**

ජනතා හිතෛෂී රාජ්‍ය සේවයක් ඇති කිරීමේදී ජනතා අපේක්ෂා මෙන්ම ජනතා ගැටළු වලටද ක්ෂණික විසදුම් ලබා දිය යුතුයි. මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ‘ඉ’ ශ්‍රී ලංකා වැඩසටහනට අනුගත වෙමින් පළාත තුල තොරතුරු තාක්ෂණ සංනිවේදන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙමින් පවති. පළාතේ සියළු සංවර්ධන කටයුතු ක්ෂණිකව දැනගත හැකි වන පරිදි සියළු සංවර්ධන යෝජනා එකම ජාලයක් තුළට ඇතුළත් කර නවීන පරිගණක වැඩසටහනක් ස්ථාපිත කර තිබේ.

එලෙසම පළාත් සභාව තුල සංවර්ධනය කර ඇති විද්‍යුත් ගිණුම් ක්‍රමය මූල්‍ය කළමනාකරණයේ ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් වී තිබේ. මීට අමතරව සියළු පළාත් සභා නිළධාරීන්ගේ තොරතුරු ඇතුළත් තොරතුරු පද්ධතියක් දැනටමත් සකස් කරමින් පවතින අතර, මේ තුළින් රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, පරිපාලන ව්‍යුහය ශක්තිමත් කරමින් රාජ්‍ය නිලධාරීන්ට පහසුකම් ඇති කිරීමටත් කටයුතු කරනු ලැබේ.

වාහන ආදායම් බලපත්‍ර ලබා දීමේදී ජාතික ප්‍රතිපත්තිය අනුව යමින් නුදුරු අනාගතයේදී නිවසේ සිටම ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීම අප විසින් තවදුරටත් සිදු කල යුතුයි. මෙම කටයුතු වලදී ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් දැනටමත් පළාත තුළ සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අවශ්‍ය පරිගණක ලබා දී තිබීම සතුටට කරුණකි.

පසුගිය කාලයේදී අපගේ උත්සවයක් හෝ විශේෂ කටයුත්තක් කිරීමට අවශ්‍ය වුවහොත් වෙනත් ආයතනයක් සතු ශ්‍රවණාගාරයක් සොයා ගැනීමට සිදුවිය. නමුත් අද පළාත් සභාව සතු ඉතා උසස් මට්ටමේ ශ්‍රවණාගාරයක් ඇත. 2014 වර්ෂයේ මධ්‍යම පළාත් කලා උළෙල පවත්වමින් 2014.10.16 දින මෙම ශ්‍රවණාගාරය විවෘත කිරීමට හැකිවීම අප ලද මහත් ජයග්‍රහණයක් ලෙස මම දකිමි. මෙම ශ්‍රවණාගාරය නාට්‍ය රඟ දැක්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම ආදී කටයුතු සඳහා බාහිර පාර්ශවයන්ට ලබා දී පළාත් සභාවට අතිරේක ආදායමක්ද උපයා ගැනීමට හැකිවනු ඇත.

## දෙවන කොටස

**ගරු සභාපතිතුමනි,**

අප විසින් මහජනතාව වෙනුවෙන් පසුගිය වර්ෂයේදී ඉටුකරන ලද කාර්යභාරයෙන් ඉතාමත් ස්වල්පයක් මෙහිදී සඳහන් කළෙමි. ඉදිරියේදීද මෙම සේවාවන් සපයමින් මහජන සුභසිද්ධිය වැඩිකර ගැනීමට බලාපොරොත්තු වන අතර, මම මෙතැන් සිට 2015 වර්ෂය සඳහා අප පළාත් සභාවේ අයවැය ඇස්තමේන්තු පිළිබඳ ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

**ලැබීම්**

| | | |
|---|---|---|
| **පුනරාවර්ථන වියදම්** | **රුපියල් මිලියන** | |
| සාමුහික ප්‍රදාන | 18,000.00 | |
| රජය විසින් ලබා දෙන ආදායම් | 3,555.00 | |
| පළාත් ආදායම් ඉලක්කය (මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර) | 1,100.00 | |
| **පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු ආදායම** | | |
| මුද්දර ගාස්තු | 890.00 | |
| උසාවි දඩ | 100.00 | |
| | | 23,645.00 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| උපමාන පාදක ප්‍රදාන | 500.00 | |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,390.00 | |
| අනෙකුත් ව්‍යාපෘති | 2,489.35 | |
| | | 4,379.35 |
| **මුළු ලැබීම්** | | **28,024.35** |

මුළු ලැබීම් රුපියල් මිලියන 28,024.35 ක මුදලින් රුපියල් මිලියන 22,655.00 ක ප්‍රමාණය පළාත් සභාවේ මහජන නියෝජිතයන් හා රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් වේතන හා අනෙකුත් පුනරාවර්ථන වියදම් ලෙස වෙන්කරන අතර, රුපියල් මිලියන 990 ක් පළාත් පාලන ආයතන වලට මාරු කිරීමටද, ඉතිරි රුපියල් මිලියන 4,379.35 ක ප්‍රමාණය ප්‍රාග්ධන වියදම් වශයෙන් අප විසින් ඉටුකළ යුතු ආර්ථික, සාමාජයීය, සංස්කෘතික හා ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා වෙන් කිරීමට අපේක්ෂිතය.

**ගරු සභාපතිතුමනි,**

2014 වර්ෂය සඳහා මා විසින් 2013 නොවැම්බර් 25 වන දින ඉදිරිපත් කළ අයවැය සඳහා මෙම ගරු සභාවේ ඔබ සියළු දෙනා වාද විවාද කරමින් ඉතා අගනා අදහස් හා යෝජනා රාශියක් ද ඉදිරිපත් කරන ලදී. එපමණක් නොව, ඉන් පසුවද සභා සැසි වාරවලදී විවිධ යෝජනා ඉදිරිපත් විය. ඒ සියල්ල ද ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අප විසින් ඉටුකළ යුතු කාර්ය භාරයද විශේෂයෙන් අප පළාතේ ජනතාවගේ ගැටළු ද හඳුනාගෙන ඒවාට මූලිකත්වය දෙමින් මෙම අයවැයේ අදාළ විෂයන්ට මුදල් වෙන් කරන ලදී. මහජනතාවගෙන් ලැබෙන යෝජනා සියල්ල ඉටු කිරීම සඳහා මෙම අයවැය තුළින් මුදල් වෙන්කර දීමට හැකියාවක් නොමැති බව ඔබ සියලු දෙනාම නොදන්නවා නොවේ. මහා භාණ්ඩාගාරයෙන් අප වෙත ලැබෙන ප්‍රදානයන් හා පළාතේ ආදායම සැළකිල්ලට ගෙන උපරිම ආකාරයෙන් ප්‍රතිපාදන වෙන්කර දීමට උත්සාහ ගත් බව තමුන්නාන්සේලාට දන්වනු කැමැත්තෙමි. කෙසේ වෙතත් පසුගිය වර්ෂයේ දී ඒ ඒ විෂයන්ට ලබා දී තිබූ මුදල් ප්‍රමාණයට වඩා මුදලක් මෙවර අයවැය මඟින් වෙන්කර දීමට උත්සාහ ගත් බව ද සතුටින් ප්‍රකාශ කරමි. එම මුදල් ප්‍රමාණයන්ගෙන් ඒ ඒ විෂයන්ට අදාලව ඉටු කළ යුතු කාර්ය භාරයන්හි ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳවත්, ඒ ඒ විෂයන්ට අදාළව වෙන් කිරීමට යෝජිත මුදල් ප්‍රමාණයන් පිළිබඳවත් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**ගරු සභාපතිතුමනි,**

පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත, මහජනතාව විසින් ඉල්ලා සිටින සංවර්ධන හෝ සුභසාධන යෝජනා ඉටු කර ගැනීම වෙනුවෙන් පළාත් ගරු මන්ත්‍රීතුමන්ලාට රුපියල් ලක්ෂ 25 බැගින් වෙන්කර දීම සඳහා රුපියල් මිලියන 145.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි. අවිච්ඡේද විය හැකි ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 6.0 ක් වෙන් කර දීමටත් යෝජනා කරමි. පළාත් ආදායම ඉහළ නැංවීම, සමබර ආර්ථික සංවර්ධනයක් පළාත තුළ ඇති කිරීම සඳහා කළ යුතු විශේෂ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 50.0 ක් වෙන් කර දීමටත් පළාතේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබා දී ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණු ලබා දීමට රුපියල් මිලියන 11.5 ක් වෙන්කර දීමටත් මෙම ගරු සභාවට යෝජනා කරමි. එමෙන්ම පළාතේ ගිණුම්කරන කටයුතු නිවැරදිව හා පහසුවෙන් ඉක්මනින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ උපකරණ ලබා දී එම කටයුතු කාර්යක්ෂමව කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 8 ක් වෙන් කර දීමට යෝජනා කරමි. රාජ්‍ය සේවය මැනවින් හා කාර්යක්ෂමව ඉටුකරලීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුය. ප්‍රවාහන පහසුකම් සලසාදීම සදහා මීට වසර දෙකකට පෙර කල් බදු ක්‍රමය යටතේ මිල දී ගත් වාහන සඳහා කල් බදු ගෙවීමටත්, ලබන වසරේ දී මිලට ගැනීමට යෝජිත වාහන කල් බදු ක්‍රමය යටතේ මිලට ගැනීම සඳහාත් රුපියල් මිලියන 189.0 ක් වෙන් කර දීමටත් යෝජනා කරමි. රජයේ නිල නිවාස අළුත්වැඩියා කිරීම හා නව නිල නිවාස ඉදි කිරීම සදහා රුපියල් මිලියන 30.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි. අප විසින් විවිධ වූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළා වුවද ඇතැම් හුදකලා ගම්මානවල කළයුතු සංවර්ධන කටයුතු තවමත් ඉතිරිව ඇත. මෙම හුදකලා ගම්මාන වල කළයුතු විශේෂ සංවර්ධන කටයුතු වෙනුවෙන්

රුපියල් මිලියන 62.0 ක් වෙන්කර දීමට ද යෝජනා කරමි. පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට උපකරණ ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 0.3 ක් හා ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ඉටුකළ යුතු හදිසි සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 1.5 ක්ද, මූලධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 4.0 ක් ද වෙන් කර දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමනි,**

ආණ්ඩුකාරවර කාර්යාලයටත් සෑම අමාත්‍යාංශයකටමත් එක් වාහනයක් බැගින් මිලට ගැනීම සඳහා රුපියල් මිලියන 52.0 ක් ඒ ඒ අමාත්‍යාංශ වෙත වෙන්කර දීමට යෝජනා කරමි.

**අධ්‍යාපන සංවර්ධනය**

පළාතේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා රුපියල් මිලියන 548.92 ක් වෙන්කර දීමට යෝජනා කරමි. මෙම මුදල ආයෝජනය කිරීම තුළින්, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට සෑම දරුවකුටම සමාන අවස්ථාවක් ලබා දීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ ඒවා ශක්තිමත් කිරීම, නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම, ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීම, ඇගයීම් ක්‍රමවේදය වඩා විධිමත් කිරීම සහ එමගින් ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මක භාවය ඉහළ දැමීම, ද්විතීයික අධ්‍යාපනයෙන් ගිලිහී යන දරුවන් වෘත්තීයමය අධ්‍යාපනයකට යොමු කිරීම උදෙසා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාසල් අධ්‍යාපනය විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයට පමණක් සීමා නොවී වෘත්තීයමය හා සමාජ කුසලතා වර්ධනය වන අධ්‍යාපන ක්‍රමයක් බවට පරිවර්තනය කිරීමට ද බලාපොරොත්තුවේ.

දරුවන්ට ඉගෙන ගැනීම සඳහා ප්‍රමාණවත් ඩෙස් පුටු තිබිය යුතුය. පාසල් වල අබලන් වූ ඩෙස් පුටු විශාල ප්‍රමාණයක් පසුගිය

කාලයේ දී එකතු වී තිබුණි. මෙම ඩෙස් පුටු අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමේ වැඩසටහනක් මීට අවුරුදු 6 කට පමණ පෙර අප ආරම්භ කරන ලදී. මෙය ඉතා සාර්ථක ප්‍රතිඵල අත්කර දෙමින් පවතින හෙයින් එය ඉදිරියට ගෙන යාමට යෝජනා කරමි.

ඉතා දුෂ්කර ප්‍රදේශ වල සේවය කරන ගුරුවරුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම අප විසින් කළ  යුතුය. එසේ නොවුණහොත් ඔවුන්ගෙන් උපරිම සේවයක් ලබා ගැනීමට නොහැකි වේ. එම නිසා පාසල් වල ගුරු නිල නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 6.0 ක මුදලක් වෙන්කර දීමට යෝජනා කරන අතර, හුදෙකලා වූ පාසල් භූමි තුළ නිල නිවාස ඉදිකිරීම එතරම් ඵලදායී නොවන හෙයින් නගරාසන්නයේ හෝ වෙනත් පහසුකම් ඇති ස්ථානවල පොදු ගුරු නිවාස ඉදිකිරීමට ද බලාපොරොත්තු වන අතර, පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ දී අත්‍යාවශ්‍ය ඉදිකිරීම් පමණක් කිරීමට බලාපොරොත්තු වෙමි.

අධ්‍යාපනය ගැන කථා කිරීමේ දී පාසල් යන දරුවන්ගේ යහපත ගැන පමණක් නොව පූර්ව ළමාවිය ගැනද අප සැලකිලිමත් විය යුතුය. දරුවන් පාසල් යාමට පෙර ඔවුන්ට ඒ සඳහා පෙර පුහුණුවක් ලබා දීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. එම නිසා පූර්ව ළමාවිය සංවර්ධනය උදෙසා රුපියල් මිලියන 5.0 ක මුදලක් වෙන්කර දීමට යෝජනා කරමි.

**පළාත් පාලන ආයතන සේවා**

මීට පෙර අවස්ථාවක දී මා ප්‍රකාශ කළ පරිදි පළාත් පාලන ආයතන ''ගමේ ආණ්ඩුව'' යන විරුදාවලිය මඟින් හඳුන්වනු ලැබේ. මහජනතාවට අවශ්‍ය බොහෝ සේවාවන් පළාත් පාලන ආයතන මඟින් ඉටු කර දෙනු ලැබේ. නමුත් ඒ සියලු අවශ්‍යතා සපුරාලීමට එම ආයතන වලට ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන හෙයින් ඔවුන් විසින් ඉටුකළ යුතු එහෙත් විශාල වියදමක් දැරීමට සිදුවන කාර්යයන්වලට මුදල් වෙන් කර දීමට යෝජනා කරමි.

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

නාගරීකරණය වේගවත් වීම, ගෘහ ආශ්‍රිත කසළ බැහැර කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම සහ අපතේ යන ද්‍රව්‍ය ප්‍රමාණය දිනපතා වැඩිවීම වැනි හේතූන් නිසා එකතුවන කසළ ප්‍රමාණය කළමනාකරණය කිරීමට සිදුවී ඇත. මෙහි දී එක් ගැටළුවක් වන්නේ කසළ බැහැර කිරීමට සුදුසු ස්ථාන නොමැති වීමයි. අපේ පළාත් පාලන ආයතනවල ගරු සභාපතිවරුන් නිතර ඉල්ලා සිටින්නේ කසළ බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙසයි. නමුත් පාරිසරික හේතූන් සහ කසළ බැහැර කරන ස්ථාන සඳහා ඇති දුර ප්‍රමාණය හා ඒ සඳහා යන වියදම වැනි හේතූන් සලකා බැලීමේ දී ඉතා විශාල වියදමක් දැරීමට සිදුවේ. එම නිසා නිවසේදීම කසළ කළමනාකරණය කර ගැනීමට ජනතාව පෙළඹවිය යුතුය. එම නිසා පළාත් පාලන ආයතන මඟින් බෙදා දෙනු ලබන කසළ බඳුන් නිවෙස් වලටම බෙදා හැරීම ප්‍රචලිත කළ යුතුය. එමෙන්ම කොම්පෝස්ට් නිපදවීම වැඩි දියුණු කළ යුතුය. මෙවැනි කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 24.0 ක් වෙන්කර දීමටත් සති පොළවල් ඉදිකිරීමට හෝ අළුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 14.0 ක් වෙන්කර දීමටත් යෝජනා කරමි. එසේම ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා ඉදිකරන ලද ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිවල අඩුපාඩු සම්පූර්ණ කිරීම හෝ එවැනි ව්‍යාපෘති ආරම්භ කර ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහාත් රුපියල් මිලියන 14.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

ජීවත්ව සිටින පුද්ගලයන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කරනවා මෙන්ම මියගිය පුද්ගලයන්ගේ අවසන් කටයුතු ගෞරවනීය ලෙස සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමද අපගේ යුතුකමක් ලෙස මම දකිමි. ඒ සඳහා දැනට ආදාහනාගාර නොමැති පළාත් පාලන ආයතනවල ආදාහනාගාර ඉදිකිරීමට හෝ දැනට පවතින ආදාහනාගාරවල අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 15.0 ක් වෙන් කර දීම සුදුසු යැයි යෝජනා කරමි.

පළාත් පාලන ආයතනවල ධාරිතා වර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි. නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මෙයට පළාත් පාලන අමාත්‍යාංශයේද සහාය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙමගින් භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය (GIS) භාවිතා කරමින් දේපල තක්සේරු කිරීම, බදු මුදල් එකතු කිරීමේ දී ප්‍රධාන කාර්යාලයට නොගොස් අන්තර්ජාල භාවිතයෙන් ගෙවීම් කිරීම, මහජන පැමිණිලි අප්‍රමාදව විමසා බලා විසඳුම් දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ. මෙම නියමු ව්‍යාපෘතිය තෝරාගත් පළාත් පාලන ආයතන කිහිපයක පමණක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

පළාත් පාලන ආයතන සතු බොහෝමයක් මාර්ග විවිධ මූලාශ්‍ර යටතේ සංවර්ධනය වී ඇත. එහෙත් තවත් මාර්ග රාශියක් වැඩි දියුණු කළයුතුව ඇත. එමෙන්ම උසස් තත්වයට සංවර්ධනය කර ඇති මාර්ග වල නඩත්තු කටයුතු ද සිදුකිරීමට ද තිබේ. මේ සඳහා රුපියල් මිලියන 139.0 ක් වෙන්කර දීමට මෙම ගරු සභාවට යෝජනා කරමි. මේ අනුව පළාත් පාලන ආයතන විසින් ඉටුකළ යුතු කාර්යයන් සඳහා වෙන්වන මුළු මුදල රුපියල් මිලියන 207.0 ක් වනු ඇත.

**සංචාරක කටයුතු**

යුද්ධය නිමා වී රට තුළ සාමය පැතිරීමත් සමඟ ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයන් ප්‍රමාණය වසරින් වසර වර්ධනය වී තිබේ. ඒ අනුව 2016 වසර තුළ ලක්ෂ 25 කට අධික විදේශ සංචාරකයින් පිරිසක් දිවයිනට පැමිණෙනු ඇතැයි විශ්වාස කෙරේ. ඉන් බොහොමයක් දෙනෙක් මධ්‍යම පළාතට ද පැමිණෙනු ඇත. සංචාරක ව්‍යාපාරය තුළින් ආදායම් උත්පාදනයවනවා පමණක් නොව සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් ද බිහිවනු ඇත. එම නිසා ස්වාභාවික සෞන්දර්යෙන් යුතු ස්ථාන, සංස්කෘතික උරුමයන් අතින් වැදගත් ස්ථාන පදනම් කර ගනිමින් දේශීය හා විදේශීය සංචාරකයන් පළාතට ගෙන්වා ගැනීමේ ව්‍යාපෘති

ක්‍රියාත්මක කිරීමට යෝජිතය. එමෙන්ම දේශීය අනන්‍යතාවයක් ඇති, සංචාරකයන්ගේ ආකර්ෂණය යොමුවන භාණ්ඩ සහ සිහිවටන නිෂ්පාදනය සඳහා නිමවුම්කරුවන් උනන්දුකරවීමටද බලාපොරොත්තු වේ. එම නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා පෞද්ගලික අංශයේද සහාය ඇතිව පවත්නා වෙළඳ පොළවල් නවීකරණය කිරීම ද වැදගත් වනු ඇත. එමෙන්ම අපගේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය කෙරෙහි බොහෝ විදේශිකයන් තුළ විශ්වාසයක් පවතී. ප්‍රතිකාර ගැනීමට පැමිණෙන විදේශිකයන් සඳහා අවශ්‍ය පහසුකම් ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී වැඩිදියුණු කිරීමට ද අපේක්ෂිතය. මෙහිදී දේශීය සංස්කෘතියට හානියක් නොවන පරිදි සංචාරක ව්‍යාපාරයට අදාල වාණිජ කටයුතු හා ක්‍රියාකාරකම් ද ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ. මෙවැනි කටයුතු ඉටුකිරීම සඳහා පෙර වර්ෂයට වඩා 23% ක වැඩිපුර මුදලක් එනම්, රුපියල් මිලියන 32.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

**ඉඩම් සංවර්ධන කටයුතු**

පළාත තුළ පිහිටි ඉඩම්වල භාරකාරත්වය දරමින් ජනතාවගේ අභිවෘද්ධිය පිණිස විවිධ පරිහරණ කටයුතුවලට යෙදවීමේ දී ආර්ථික, සාමාජයීය හා පාරිසරික සාධක සමතුලිතව හා මනා කළමනාකාරීත්වයෙන් පවත්වාගෙන යාමටත්, ජනපද ඉඩම්වල අවශ්‍ය යටිතල පහසුකම් සලසා දීමටත්, අපේක්ෂාකරන අතර ඒ සඳහා රුපියල් මිලියන 5.0 ක් ද, රජයේ ගොඩනැගිලි පිහිටා ඇති ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා ගෙවීමට රුපියල් මිලියන 3 ක් ද, මහවැලි යෝජනා ක්‍රමය යටතේ ඉදිකර පළාත් සභාවට පවරා දී ඇති වත්කම් නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 7.0 ක් ද වෙන්කර දීමට යෝජනා කරමි.

## සංස්කෘතික කටයුතු

මධ්‍යම පළාතේ ස්පර්ශණීය හා අස්පර්ශණීය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කරමින් එම කටයුතුවල නියුක්තවන්නන් ආරක්ෂා කිරීමටත්, කලාකරුවන්ගේ ශුභසාධනය, ආගමික, සංස්කෘතික, සදාචාරාත්මක හා ආධ්‍යාත්මික යහගුණයන් ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා රුපියල් මිලියන 4.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

සමූපකාර ව්‍යාපාරය කලක් ඉතා මන්දගාමී තත්ත්වයට පත් වී තිබුණ අතර එය නවීකරණය කිරීම නිසා දැනට එහි යම්කිසි ප්‍රගතියක් දක්නට ලැබේ. එය තවදුරටත් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දී ආදායම් ප්‍රවර්ධන කටයුතු කිරීම සඳහා රුපියල් මිලියන 5.0 ක් වෙන්කර දීමට යෝජනා කරන අතර සමූපකාර සේවක කොමිෂන් සභාව සඳහා රුපියල් මිලියන 0.4 ක් ද වෙන්කර දීමට යෝජනා කරමි.

ප්‍රධාන අමාත්‍යාංශයට අයත් විෂයන්හි හදිසියේ කළ යුතු සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 1.5 ක් ද, අමාත්‍යාංශය සඳහා ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 11.0 ක් ද, වෙන්කර දීමට යෝජනා කරමි.

## සෞඛ්‍ය සේවා

සෞඛ්‍ය ක්ෂේත්‍රයට මුදල් ආයෝජනය කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ ජනතාව නීරෝගිව හා සෞඛ්‍ය සම්පන්නව තබා ගැනීම තුළින් ශ්‍රම ඵලදායිතාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීමයි. මෙහිදී රෝග වළක්වා ගැනීම හා රෝග නිවාරණය යන අංශ දෙක කෙරෙහිම අවධානය යොමුකළ යුතු අතර, වැඩි සැළකිල්ලක් දැක්විය යුත්තේ රෝග වළක්වා ගැනීම කෙරෙහිය. වර්තමානයේ බෝ නොවන රෝග තත්ත්වයන් හා මරණ ඉතා බහුල නිසා බෝනොවන රෝග වළක්වා ගැනීමට විශේෂ වැඩසටහන් හඳුන්වා දීමද අත්‍යාවශ්‍ය වේ.තවද

වසංගත රෝග බෝවීම හැකිතාක් දුරට අවම කර ගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල්ව ක්‍රියාත්මක කිරීමද අත්‍යාවශ්‍ය වන අතර, මේ සඳහා බටහිර හා දේශීය වෛද්‍ය අංශ දෙකම ඒකාබද්ධව ක්‍රියාකිරීම වැදගත් වේ.

දේශීය වෛද්‍ය අංශය මගින් පාරම්පරික වෛද්‍ය ක්‍රමය කෙරෙහි තවදුරටත් අවධානය යොමුකර ඒවා ආරක්ෂාකර මහජනතාවට වඩා ක්‍රමවත් සේවාවක් ලබා දීමට කටයුතු කරනු ඇත. එසේම ආර්ථික දුෂ්කරතා හේතුවෙන් තම පාරම්පරික වෙදකම මනාව ක්‍රියාත්මක කිරීමට අපහසුව සිටින දේශීය වෛද්‍යවරුන් හඳුනාගෙන ඔවුන්ගේ වෛද්‍ය ක්‍රමය වැඩිදියුණු කිරීමට පියවර ගනු ඇත.

බටහිර සෞඛ්‍ය සේවා කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 546.0 ක්ද, දැනට වැඩිදියුණු කරමින් පවතින තෙල්දෙණිය මූලික රෝහලේ ඉතිරි කටයුතු කරගෙන යාම සඳහා රුපියල් මිලියන 420.0 ක්ද, මහනුවර සියා ආරෝග්‍ය ශාලාවේ ඉතිරි කටයුතු සඳහා රුපියල් මිලියන 2.21 ක් ද වෙන්කර දීමට යෝජනා කරමි. එමෙන්ම දේශීය වෛද්‍ය කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 24.0 ක්ද වෙන්කර දීමට යෝජනා කරමි.

**පරිවාස හා ළමාරක්ෂක සේවා**

දෙමාපියන්ගේ ආර්ථික දුෂ්කරතා නිසා හෝ වේවා, ඔවුන්ගේ නොමනා ක්‍රියාකාරකම් නිසා හෝ වේවා, සමාජයේ විෂමාචාර පුද්ගලයන් නිසා හෝ වේවා, වෙනත් කරුණක් නිසා හෝ වේවා අසරණ වන දරුවන් රැකබලා ගැනීමට අපට සිදුවේ. මෙම දරුවන්ට අවශ්‍ය රැකවරණය ලබා දී ඔවුන් සමාජයට යහපත් පුරවැසියන් බවට පත් කිරීම සඳහා ක්‍රියා කිරීමටත් එවැනි අවස්ථා ඇති නොවන ආකාරයට සමාජය දැනුවත් කිරීම සඳහාත් රුපියල් මිලියන 14.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි. එමෙන්ම ලෝක ජනගහන වාර්තා අනුව සමාජයේ වැඩිහිටි ජනගහනය

ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවති. දරුවන්ගේ රැකවරණය නොමැතිව වැඩිහිටි නිවාස වල ජීවත්වන වැඩිහිටි පරපුර රැකබලා ගැනීම, ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සහ ස්වභාවික හේතූන් නිසා හෝ වේවා, වන සතුන්ගෙන් හෝ වේවා, අසරණභාවයට පත්වන ජනතාවට පිහිටවීම හා සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයන්ට ස්වයං රැකියාවක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, ආදී කටයුතු සඳහා රුපියල් මිලියන 12.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි. එමෙන්ම සෞඛ්‍ය, දේශිය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සමාජ සේවා අමාත්‍යාංශයේ හදිසි සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 1.5 ක් ද ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 6.0 ක් වෙන්කර දීම සුදුසුයැයි යෝජනා කරමි.

**කෘෂිකාර්මික කටයුතු**

යැපුම් මට්ටමේ කෘෂිකාර්මික කටයුතු කරන ගොවීන් මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණයේ කෘෂි ව්‍යවසායකයින් කෙරෙහිද යොමුවී, ඵලදායි ලෙස කෘෂිකාර්මික කටයුතු පවත්වා ගෙන යාමට ඔවුන් උනන්දු කරවිය යුතුය. සුළු හා මධ්‍ය පරිමාණයේ කෘෂි ව්‍යවසායකයින්ගෙන් ඵලදායි නිෂ්පාදනයක් බලාපොරොත්තු විය හැකි අතර, එමගින් ග්‍රාමීය මට්ටමේ රැකියා අවස්ථාවන්ද උත්පාදනය වනු ඇත. කෘෂි අංශයේ ආයෝජනය තුළින් වී වගාව, වෙනත් කේෂත්‍ර භෝග, පලතුරු සහ එළවළු ආදියෙහි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය ඇතුළු යෙදවුම් ගොවීන්ට ලබා දීම, කෘෂිකාර්මික තාක්ෂණික දැනුම ලබා දීම, ඔවුන්ගේ නිෂ්පාදනයන්හි එකතුකල වටිනාකම් අගය ඉහළ නැංවීම, භෝග විවිධාංගිකරණය හා නව කෘෂි ශිල්ප ක්‍රම ආදිය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම කරනු ලැබේ. එපමණක් නොව රසායනික පොහොර භාවිතය අවමකර කාබනික පොහොර භාවිතය ඉහළ නැංවීම, දේශීය බීජ නිෂ්පාදනය දිරි ගැන්වීම ආදිය කෙරෙහිද අවධානය යොමුකරනු ඇත.

සම්ප්‍රදායික වී වර්ග භාවිතා කිරීමෙන් පිරිවැය අවම කරනවා පමණක් නොව ඉහළ ආදායමක්ද ලබා ගත හැකි බව දක්නට ලැබේ. එමනිසා වී ගොවීන් ඒ කෙරෙහිද යොමු කිරීම අවශ්‍ය වේ.

ලොකු ළූණු හා අර්තාපල් වගාව මධ්‍යම පළාත තුළ විශාල වශයෙන් සිදු කෙරේ. එම නිෂ්පාදනයන්ගේ මිල උච්චාවචනය අවම කිරීම සදහා රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව නිෂ්පාදන සාධාරණ මිලකට මිලදී ගැනීම සඳහා ක්‍රම වේදයක් හදුන්වා දීම කාලීන අවශ්‍යතාවයක් වේ. මෙම කටයුතු ඉටු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 51.0 ක් වෙන් කර දීම සුදුසු යයි යෝජනා කරමි.

එළවළු හා පලතුරු ගොවීන්ට සාධාරණ මිලක් ලබා ගැනීමට අපහසු වී ඇත්තේ, එම නිෂ්පාදන විශාල වශයෙන් අපතේ යාම, ප්‍රවාහනයේදී ඇති වන අලාභහානි නිසාය. විශේෂයෙන්ම කෘෂි බිම් ආශ්‍රිතව මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමෙන් හා සුදුසු ඇසුරුම් ක්‍රමයක් භාවිතා කිරීමෙන් එම ගැටළුව මගහැරී යනු ඇතැයි මම විශ්වාස කරමි. එම නිසා කෘෂිමාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 7.0 ක් වෙන්කර දීමට යෝජනා කරන අතර එහිදී මාර්ග විශාල ප්‍රමාණයක් තෝරා ගැනීම වෙනුවට මාර්ග කිහිපයක් පමණක් තෝරාගෙන සංවර්ධනය කිරීම උචිතයැයි සිතමි.

**පශු සම්පත් සංවර්ධනය**

නිරෝගී සහ ඵලදායි සත්ත්ව ගහණයක් පළාත තුළ පවත්වාගැනීම, ව්‍යාප්ති සේවය පුළුල් කිරීම, ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, මධ්‍ය පරිමාණයේ කිරි ගොවීන් පිරිසක් බිහි කිරීමෙන් ඔවුන් ව්‍යවසායකයන් බවට පත්කර තිරසාර ආදායම් මට්ටමක් පවත්වාගෙන යාමට හැකියාව ඇත. කිරි නිෂ්පාදනය පමණක් නොව බිත්තර සහ මස් ආදී නිෂ්පාදනයන්

කෙරෙහිද අපගේ අවධානය යොමු කළ යුතු වේ. පශු සම්පත් සංවර්ධනය උදෙසා රුපියල් මිලියන 32.0 ක මුදලක් වෙන්කර දීමට යෝජනා කරමි.

## සුළු වාරිමාර්ග සංවර්ධනය

මධ්‍යම පළාත තුළ පළාත් සභාව විසින් නඩත්තු කළ යුතු සුළු වාමාර්ග 3,876 ක් පවතී. සෑම වර්ෂයකම මින් කොටස බැගින් සංවර්ධනය කළත් ඒවායෙහි අවසානයක් දැකිය නොහැක්කේ ගොවීන් විසින් හෝ ගොවි සංවිධාන විසින් හෝ මේවා නඩත්තු කර නොගැනීමත්, අධික වර්ෂාව නිසා මේවාට අලාභ හානි සිදු වීමත් නිසාය. ඈත අතීතයේ පැවති වාරිමාර්ග හෝ වැව් නඩත්තු කිරීමේ ක්‍රමය අදත් පැවතියා නම් රජය මගින් මෙම වාරිමාර්ග නඩත්තු කිරීමට මුදල් වැය කිරීම අවශ්‍ය නොවේ. රජය සුළු වාරිමාර්ග නඩත්තු කිරීම තුළින් වගා බිම් වලට අවශ්‍ය ජල සැපයුම තහවුරු කළ යුතු අතර එහිදී වගා බිම් දක්වා ජලය ගෙන යාමට අවශ්‍ය සෑම කාර්යයක් කෙරෙහිම අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා වාරි මාර්ග ක්‍රම නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය කිරීම, නව වාරිමාර්ග ක්‍රම ඉදිකිරීම සහ විධිමත් ජල කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන අතර, මෙම කාර්යන්හි දී ගොවි සංවිධානවල සහභාගීත්වය උපරිම ආකාරයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. වී වගාවට අමතරව ජලය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම හා කළමනාකරණය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමෙන් අතුරු බෝග සඳහා අවශ්‍ය ජලය ලබා දීමට ද හැකිවනු ඇත. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා රුපියල් මිලියන 24.0 ක් වෙන් කර දීම සුදුසු යැයි යෝජනා කරමි.

## මිරිදිය ධීවර කටයුතු

ග්‍රාමීය ජනතාවට මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම තුලින් ජනතාවගේ පෝෂණ ඌණතාවයන් අවම කිරීම මෙන්ම මිරිදිය ජලාශ ආශ්‍රිත පදිංචිකරුවන්ට මිරිදිය මාළු අඩු මුදලකට ලබා ගත හැකි වන

පරිදි ක්‍රමවේද සැකසීම, මත්ස්‍ය නිෂ්පාදන වැඩි කිරීම, අලෙවි පහසුකම් වැඩි දියුණු කිරීම, වෙළඳපල සම්බන්ධීකරණය ඇති කිරීම සහ විසිතුරු මසුන් ඇති කිරීම ප්‍රවර්ධනය යන අරමුණු පෙරදැරිව පසුගිය වර්ෂ තුළ මාළු පැටවුන් මිලියන 5.4 ක් ජලාශ වලට මුදා හැරීම, ඔරු 34 ක් හා දැල් ආම්පන්න 514 ක් බෙදා දී ඇති අතර අලෙවි කුටි 34 ක් ද ස්ථාපනය කර තිබේ. විසිතුරු මසුන් අලෙවි කිරීමෙන් එම ව්‍යාපාරිකයන් හොඳ ආදායමක් උපයාගනු ඇත. මෙම වැඩසටහන් ඉදිරියේදීද ඉටුකිරීම සඳහා රුපියල් මිලියන 7.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## පරිසර කටයුතු

පරිසරය යන්නෙන් අදහස් කරන්නේ අප අවට ඇති සියලු දේවල්ය. ගහකොළ, සතා සිව්පාවා, ඇළ දොළ, ගංගා ආදී කී නොකී සියළු දේවල් මෙයට ඇතුළත් වේ. මෙම දේවල් ආරක්ෂාකර ගැනීම අපට පමණක් නොව මතු පරම්පරා වලටත්, මිහිපිට ජීවත් වන සියලු දෙනාටත් යහපත් ජීවන තත්වයත් උදාකර ගැනීමට උපකාරී වේ. විවිධ පුද්ගලයන් විවිධ ආකාරයෙන් පරිසර විනාශය සිදුකරනු ලැබේ. මේවා නොදැනුවත්කම නිසා සිදුකරන දේවල් බව සිතිය නොහැක. තමන්ගේ ආත්ම ලාභය සඳහාම කරන බව සිතිය හැක. පරිසරය විනාශ කිරීම තමන්ගේ ජීවිතය විනාශ කර ගැනීමක් ලෙස දැක්විය හැක. මේ ආකාරයට සිදුකරන විනාශය යථා තත්වයට පත්කර ගැනීම කිසිදා සිදුකළ නොහැක. එහෙත් පරිසරය සුරැකීමට කටයුතු කිරීම අපගේ යුතුකමකි. සුදුසු ස්ථානවල සුදුසු ගස් වර්ග වගා කිරීම, කැළෑ ගිනි තැබීම වැලැක්වීම, සතා සිවුපාවුන්ට අවශ්‍ය පරිසරය ආරක්ෂාකර දීම සහ ඔවුන් විනාශ නොකිරීම, ආදී වශයෙන් නොයෙක් ආකාරයේ ක්‍රියාකාරකම් අපට සිදුකල හැක. විශේෂයෙන් පාසල් දරු දැරියන් පරිසරය සුරැකීම සඳහා යොමු කිරීම ඉතා වැදගත් වේ. මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 5.5 ක මුදලක් වෙන්කර දීමට යෝජනා කරන අතර, එම මුදල ප්‍රමාණවත් නොවන බව

සඳහන් කරමි. එම නිසා ඔබතුමන්ලාගේ විමධ්‍යගත අයවැයෙන්ද මුදල් යොදවා ගම්වල සමිති සමාගම් සම්බන්ධ කර ගනිමින් තම තමන්ගේ බල ප්‍රදේශවල පරිසරය සුරැකීමේ වැඩසටහන් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිමි.

## හින්දු සංස්කෘතික කටයුතු

අපගේ සහෝදර ද්‍රවිඩ ජනතාවගේ හින්දු ආගමික කටයුතු හා ඔවුන්ට ආවේණික සංස්කෘතික කටයුතු ආරක්ෂාකර ගැනීම සඳහා කටයුතු සලසා දීම අප පළාත් සභාවේ යුතුකමකි. හින්දු දහම් පාසල් සංවර්ධනය, දමිළ ජනතාවගේ කලා කටයුතු, සාහිත්‍ය කටයුතු, නැටුම් ගැයුම් වැනිදේ සුරක්ෂිත කිරීම හා ප්‍රචලිත කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 2.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## වතු මාර්ග සංවර්ධනය

වතුකරයේ මාර්ග බොහොමයක් මේ වන විට විවිධ මුලාශ්‍ර යටතේ කොන්ක්‍රීට් දමා සංවර්ධනය කර ඇත. තවත් සංවර්ධනය කළයුතු මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 32 ක මුදලක් වෙන්කර දීමට යෝජනා කරන අතර, වතු අධිකාරියේ හා කුඩා තේ වතු හිමියන්ගේ සංගම්වල සහයෝගය ලබා ගනිමින් මෙම මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය කළ හැකි වේ.

කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය යටතට ගැනෙන විෂයයන්හි හදිසි සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 1.5 ක්ද මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 1.0 ක්ද, වෙන්කර දීමට යෝජනා කරමි.

## මාර්ග

ඉදිරි වර්ෂයේදී මාර්ග වැඩිදියුණු කිරීම සඳහා මාර්ග තෝරා ගැනීමේ දී මාර්ගය භාවිත කරනු ලබන මගී ප්‍රමාණය, ජාතික මාර්ග

පද්ධතිය සමඟ ඇති සම්බන්ධතාවය, ආර්ථික කටයුතු කෙරෙහි ඇති බලපෑම වැනි කරුණු සැලකිල්ලට ගනු ඇත. මාර්ග නඩත්තු කිරීමේ දී ඒවායේ තිරසාරභාවය තහවුරු වන පරිදි ප්‍රදේශයේ භූමිය හා දේශගුණ තත්ත්වය ආදිය සැලකිල්ලට ගනු ඇත.

මාර්ග සංවර්ධනය සඳහා පළාත් සභා අරමුදල් යටතේ රුපියල් මිලියන 291.0 ක්ද, දැනටමත් තෝරාගෙන ඇති මාර්ග ඉතා උසස් තත්ත්වයෙන් සංවර්ධනය කිරීම සඳහා ජයිකා ආධාර යටතේ රුපියල් මිලියන 1,371.22 ක මුදලක්ද වෙන්කර දීමට යෝජනා කරමි. මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ කි. මි. 600 ක් ද 2015 වර්ෂයේදී කාපට් අතුරා සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවේ.

## විදුලිබල හා විකල්ප බලශක්ති

ශ්‍රී ලංකාවේ සෑම නිවසකටම විදුලිය සැපයීම රජයේ ප්‍රතිපත්තිය වේ. මේ සඳහා රජය විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. දැනට පළාත තුළ විදුලි බලය නොමැති පවුල් සංඛ්‍යාව 20,256 ක් පමණ ඇත.දැනට පළාතේ ජීවත්වන පවුල් ප්‍රමාණයෙන් 96.9% කට විදුලිය සපයා ඇත. පළාත් සභාවක් ලෙස අපට පැවරී ඇත්තේ ජාතික විදුලිබල පද්ධතියෙන් ඉදිරි වර්ෂ 3 තුලදී විදුලිය සැපයීමට අපොහොසත් වන ප්‍රදේශ වලට ශක්‍යතාවයෙන් යුත් විකල්ප විදුලි ජනනයන් ලබා දීමයි. ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලි දිගු ලබා දීමේ දී තනි නිවාස සඳහා විදුලි රැහැන් ඇදීමක් නොව, පොදු විදුලි දිගු සඳහා ප්‍රතිපාදන ලබා දීම ද සිදු කෙරේ. මෙම කටයුතු සඳහා රුපියල් මිලියන 15.0 ක මුදලක් වෙන් කර දීමට යෝජනා කරමි.

## ප්‍රවාහන කටයුතු

මගී ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීම අපගේ බලාපොරොත්තුව වේ. මෙහිදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මඟින් නඩත්තු කෙරෙන බස් නැවතුම් අංගනයන් හැර අනෙකුත් බස් රථ අංගන

ඉදිකිරීම හා අළුත් වැඩියා කිරීමටත්, මගී ආවරණ ඉදිකිරීමටත්, මුදල් වෙන්කර දීමට බලාපොරොත්තු වෙමි. මෙම කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 24.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

**නිවාස සංවර්ධනය**

දිළිඳු පුද්ගලයින්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ආධාර හා සෙවිලි තහඩු ලබා දීමටත් අඩු ආදායම් ලාභීන්ට අඩු පොලියට නිවාස ණය ලබා දීම සඳහාත් රුපියල් මිලියන 5 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

විදුලිබල, බලශක්ති හා නිවාස අමාත්‍යාංශයේ විෂයය පථයට ගැනෙන අංශයන්හි හදිසි සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 1.5 ක්ද අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු සහ ආයතනවල මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 1.0 ක්ද වෙන් කිරීමට යෝජනා කරමි.

**සුළු කර්මාන්ත සංවර්ධනය, ව්‍යාපාර ප්‍රවර්ධනය හා වෘත්තීය පුහුණුව**

පළාත තුළ ඇති සම්ප්‍රදායික නිෂ්පාදන දිරි ගැන්වීම, ඒවායේ ගුණාත්මක භාවය තහවුරු කිරීම, වෙළඳ පොළ සම්බන්ධීකරණය හා නව තාක්ෂණය හඳුන්වා දීම වැනි ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමුකර කර්මාන්තකරුවන්ගේ ආදායම තහවුරු කිරීමත්, ඒවා සුරක්ෂිත කිරීමත්, එම අංශ සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් පුහුණු කිරීමත් කළයුතුව ඇත. රැකියා නොමැති එහෙත් යම්කිසි වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින තරුණ තරුණියන් ඒ සඳහා පුහුණු කිරීම ද අවශ්‍ය වේ. වෘත්තීය පුහුණුවක් ඇති තරුණ තරුණියන්ට දේශීය මෙන්ම විදේශීය රැකියා වෙළඳපොළ ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. වෘත්තීය පුහුණුව ලබා දීමේදී පුහුණුව අවසානයේ ලබාදෙන සහතික ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික සමග අනුගත විය යුතුය. පුහුණුව අවසන් කරන දක්ෂ සිසුන් කිහිපදෙනෙකුට කර්මාන්ත ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනය අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා වාණිජ මණ්ඩල,

මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල, ප්‍රාදේශීය බැංකු සමග සම්බන්ධීකරණයක් ඇති කර දීම ද අවශ්‍ය වේ. මෙම කටයුතු සඳහා රු.මි. 16.0ක් වෙන් කර දීමට යෝජනා කරමි.

**පේෂකර්මාන්තය**

ශ්‍රී ලංකාවේ පේෂකර්මාන්තයට අතීතයේ දී ඉතා හොඳ තත්ත්වයක් තිබුණ ද අද එම නිෂ්පාදන සඳහා එතරම් ඉල්ලුමක් නැත. අප උත්සාහ කළහොත් නැවත එය දියුණු තත්ත්වයට ගෙන ඒමට හැකියාවක් ඇත. පළාතේ ඇති පේෂකර්ම මධ්‍යස්ථාන බොහොමයක් පැරණි ඒවාය. ඒවායෙහි ඇති යන්ත්‍ර හා උපකරණ යල්පැන ගොස් ඇත. ඒවායින් ඉතා හොඳ නිෂ්පාදනයක් බලාපොරොත්තු විය නොහැක. නමුත් ඉතා හොඳ තත්ත්වයේ පවතින ඒවාද ඇත. පේෂකාර්මිකාවන්ගේ ආදායම ඉතා පහළ මට්ටමක පවතින හෙයින්, ඒ කෙරෙහි කාන්තාවන්ගේ ආකර්ෂණය අඩුය.

ඇතැම් පේෂකර්ම නිෂ්පාදන විදේශ සංචාරකයන්ගේ සිත් ඇදගන්නා සුළු ඒවාය. එම නිසා විදේශ විනිමය උපයා ගැනීමටත් කාන්තාවන්ට රැකියා සැපයීමටත් හැකිවන මෙම කර්මාන්තය නගාසිටුවීම අත්‍යාවශ්‍ය වේ. පේෂකර්ම නිෂ්පාදනයන්හි අලෙවිය රාජ්‍ය අංශය මගින් පවත්වාගෙන යාම ඵලදායි නොවන බව පෙනේ. එමනිසා සංචාරක දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ වී පෞද්ගලික අංශයේ ද සහයෝගය ඇතිව රෙදිපිළි අලෙවිය ප්‍රවර්ධනය කිරීමේ කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. පේෂකර්මාන්තය නගාසිටුවීමට අවශ්‍ය කටයුතු වෙනුවෙන් රු.මි. 10.0 ක් වෙන්කර දීම සුදුසුයැයි යෝජනා කරමි.

**ග්‍රාම සංවර්ධනය**

ග්‍රාම සංවර්ධන සමිති මගින් ගමේ දියුණුවට විශාල වැඩ කොටසක් ඉටුකළ හැකිය. ගමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒවා ඉටුකර දීම මෙම සමිතිවල වගකීමයි. ග්‍රාම සංවර්ධනය සඳහා වෙන් කරන මුදලින් ගම් ආශ්‍රිත කුඩා පාරවල්, කුඩා පාලම් හා බෝක්කු, කෘෂි මාර්ග,

ග්‍රාමීය වෙළඳ පොළ පහසුකම්, සුසානභූමි, පුස්තකාල, පානීය ජලය සැපයීම ආදී කාර්යයන් කේන්ද්‍රකර ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ශුභසිද්ධිය ඉහළ නැංවීමේ හා ජීවන කටයුතු පහසු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. එසේම පළාත තුළ නිවාස ව්‍යාපෘති හෝ ග්‍රාමීය මට්ටමේ වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයා දී ඉතා වැදගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.මි. 20.0 ක් වෙන්කර දීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

## ක්‍රීඩා කටයුතු

පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒමට උපකාරිවීම, පළාතේ ජනතාව ක්‍රීඩා හා ශාරීරික සුවතා කටයුතුවලට යොමු කර සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීමට අවශ්‍ය කටයුතු කිරීම මෙම අංශයෙන් බලාපොරොත්තුවන අතර ඒ සඳහා රු. මි. 17.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## තරුණ කටයුතු සහ වනිතා කටයුතු

පළාතේ තරුණ තරුණියන්ගේ හා වනිතාවන්ගේ අභිවෘද්ධිය සඳහා කටයුතු කරමින් ඔවුන් ගෘහයේ හා සමාජයේ සංවර්ධන ක්‍රියාදාමයට යොමු කර ඵලදායි සේවයක් ලබාගැනීමටත්, තරුණ තරුණියන් නොමග යෑම වළක්වා ගැනීමටත් කටයුතු කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම අන්තරාදායක ඖෂධ භාවිතය වළැක්වීම, තරුණ තරුණියන්ට රැකියා පුහුණුව, ජීවන කුසලතා සංවර්ධනය, ගෘහ පාලන කටයුතු ආදී වැඩසටහන් මෙමගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහිදි ඒ ඒ කටයුතු කිරීමේ දී පළාතේ විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. තරුණ කටයුතු සඳහා රුපියල් මිලියන 9.0 ක් ද, වනිතා කටයුතු සඳහා රු.මි. 5.0 ක් ද වෙන් කරදීමට යෝජනා කරමි.

කර්මාන්ත, පේෂකර්ම, වනිතා කටයුතු අමාත්‍යංශයේ විෂය පථයට ගැනෙන අංශයන්හි හදිසි සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.මි. 1.0 ක්ද මූලධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රු.මි. 2.0 ක්ද වෙන්කර දීමට යෝජනා කරමි.

**ඉදිකිරීම් කටයුතු**

පළාත් සභාව මගින් හෝ වෙනත් මූලාශ්‍ර මගින් හෝ ලැබෙන මුදල් උපයෝගී කරගෙන ඉදිකර ඇති හෝ අඩක් නිමකර ඇති කිසිම ප්‍රයෝජනයක් ගෙන නොමැති ගොඩනැගිලි ඇතැම් ආයතන සතුව පවතින බව හෙළිවී ඇත. මෙසේ අඩක් නිමකර ඇති ගොඩනැගිලිවල වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගතහැකිනම් පමණක් ඒවා නිම කිරීමටත්, ප්‍රයෝජනයට ගෙන නොමැති ගොඩනැගිලි ඇතොත් ඒවා සුදුසු ආයතනවලට පවරා දීමටත් කටයුතු කරන අතර ඉදිරි වර්ෂයේ දී නිසි අධ්‍යයනයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීමට බලාපොරොත්තු නොවේ. අත්‍යාවශ්‍යවන ගොඩනැගිලි පමණක් ඉදිකිරීමට නියමිතය.

එසේම ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන යෝජනා නියමිත කාලය තුළදීම නිම කිරීමට වග බලා ගැනීමටත්, වර්ෂ අවසානය වනතෙක් නොසිට මුදල් ගෙවා අවසන් කිරීමට සැලසුම් කළ යුතු බවත්, අවිච්ඡින්න ව්‍යාපෘති හැර ව්‍යාපෘති අවිච්ඡේද නොකළ යුතු බවත් අවධාරණය කරමි.

**ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු විපක්ෂ නායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි,**

මේ දක්වා මා ඉදිරිපත් කරන ලද්දේ පළාත් භාණ්ඩාගාරයට ලැබීමට නියමිත මුදල් ඒ ඒ කටයුතු සඳහා වෙන්කර දීමට යෝජිත ආකාරයයි. මෙම මුදල් ප්‍රමාණයන් ඒ ඒ ආයතන මඟින් මහජනයාට ලබා දීමට අවශ්‍ය සේවාවන් උපරිම ආකාරයෙන් ලබා දීම සඳහා ප්‍රමාණවත් නොවන බව මම දනිමි. එසේ වුවද 2014 වර්ෂයට වඩා යම්කිසි මුදලක්

2015 වර්ෂයේ දී වැඩිපුර ලබා දීමට උත්සහා ගත්තෙමි. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ යුතුකම වන්නේ මෙම වෙන්කර දී ඇති ප්‍රතිපාදනයන්ගෙන් මහජනතාවගේ සුභ සිද්ධිය, ආර්ථික තත්ත්වය, සමාජ සුභ සාධනය හා සංස්කෘතිය ඉහළ නංවාගැනීමටත්, රටේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට පළාතේ දායකත්වය ඉහළ නංවා ගැනීමටත් හැකිවන පරිදි සුදුසු යෝජනා හා ව්‍යාපෘති සකස් කර මනා කළමනාකාරීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කිරීමයි.

**ගරු සභාපතිතුමනි,**

මේ ආකාරයට අප විසින් වෙන්කර දෙනු ලැබූ මුදල් ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශ වලින් ද, වෙනත් ව්‍යාපෘති මඟින් ද, අප පළාතට ලැබෙනු ඇත. එමගින් එම නියමිත සංවර්ධන කටයුතු ද ඉටුකිරීමට සිදුවී ඇත්තේ ද අපගේ නිලධාරින් මඟින්ය. එම ව්‍යාපෘතීන්ද නිසි කලට වේලාවට නිම කර මුදල් ප්‍රතිපූරණයක් කර ගන්නා ලෙස ද ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිතුමනි,**

පළාතේ උන්නතිය උදෙසා විශේෂ අවධානයෙන් කටයුතු කර අපට අනුශාසනා දෙනු ලබන මහ නායක හිමිවරුන් ඇතුළු සියළු ආගමික නායකවරුන් වෙත මාගේ නමස්කාර පූර්වක ස්තූතිය මුලින්ම පිරිනමමි. අපගේ පළාත් සභාවේ කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර අපට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් කටයුතු කරනු ලබන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මාගේ ගෞරවනීය ස්තූතිය පිරිනමමි. එමෙන්ම පළාත් සභාවේ සියළු කටයුතු කෙරෙහි නිතරම සැලකිල්ලක් දක්වමින් නිවැරදි ඉලක්ක කරා යාමට අපව දිරිමත් කරනු ලබන ගරු ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමාට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

පළාත් සභා කටයුතු මෙහෙයවමින් තුලනාත්මක සේවයක් ඉටු කරනු ලබන ගරු සභාපතිතුමා සහ නියෝජ්‍ය සභාපතිතුමාට මාගේ කෘතඥතාවය පිරිනමමි. එමෙන්ම සංවර්ධන කටයුතුවලට මෙන්ම අප විසින් ඉටුකළ යුතු කාර්ය භාරය නිවැරදි දිශාවට අනුගත කිරීමට අදහස් හා යෝජනා ඉදිරිපත් කරනු ලබන විපක්ෂ නායකතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයට මාගේ ස්තූතිය පිරිනමමි.

පළාත් රාජ්‍ය සේවයේ සියළු නිලධාරින් මෙහෙයවමින්, මූල්‍ය කළමනාකරණය, යහපාලනය සඳහා කරනු ලබන මෙහෙය වෙනුවෙන් ප්‍රධාන ලේකම්තුමා, ආණ්ඩුකාර ලේකම්තුමා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමිය, අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පිරිනමමි.

මධ්‍යම පළාතේ සභා ලේකම්, සහකාර ලේකම් ඇතුළු සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය කරනු ලබන උසස් සේවය අගය කරමින් ඒ සියළු දෙනාටත් මාගේ ස්තූතිය පිරිනමමි.

අපගේ සංවර්ධන යෝජනා බොහොමයක් ක්‍රියාත්මක කරනු ලබන ගරු නගරාධිපතිවරුන්, ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් තිදෙනා සහ ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු එම කාර්ය මණ්ඩල වලටද මාගේ ස්තූතිය පිරිනමමි.

පළාත් සභාවේ කටයුතු මහජනතාවගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීම සහ නව යෝජනා ඉදිරිපත් කරමින් ලබාදෙන සහයෝගය පිළිබඳ සියළු මාධ්‍ය හිතවතුන්ටද මාගේ ස්තූතිය පිරිනමමි.

අපට ආරක්ෂාව සපයමින් ඉටු කරනු ලබන සේවය වෙනුවෙන් කුණ්ඩසාලේ පොලිස් ස්ථානාධිපති ඇතුළු සියළු ආරක්ෂක නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පිරිනමමි.

අවසාන වශයෙන් අපගේ ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළු ඔබ සැමගේ සහාය අපේක්ෂා කරමි.

ඔබ සැමට දළදා සමිඳු පිහිටයි!

සරත් ඒකනායක

ප්‍රධාන අමාත්‍ය

මධ්‍යම පළාත

2014.11.04

# ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

## සාරාංශය

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | ආණ්ඩුකාරවර කාර්යාලය, සභා ලේකම් කාර්යාලය සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | 20.80 | 20.80 |
| 2 | ප්‍රධාන ලේකම් කාර්යාලය | 112.00 | 395.30 | 507.30 |
| 3 | ප්‍රධාන අමාත්‍යංශය | 812.92 | 32.90 | 845.82 |
| 4 | සෞඛ්‍ය අමාත්‍යංශය | 1,016.21 | 16.50 | 1,032.71 |
| 5 | කෘෂිකර්ම අමාත්‍යංශය | 155.00 | 15.00 | 170.00 |
| 6 | මාර්ග සංවර්ධන අමාත්‍යංශය | 1,706.22 | 9.50 | 1,715.72 |
| 7 | කර්මාන්ත අමාත්‍යංශය | 77.00 | 10.00 | 87.00 |
| | **මුළු එකතුව** | **3,879.35** | **500.00** | **4,379.35** |

# ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

## ප්‍රධාන ලේකම් කාර්යාලය

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩ සටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | ගරු මන්ත්‍රීතුමන්ලාගේ විමධ්‍යගත අයවැය | - | 145.00 | 145.00 |
| 2 | අවිච්ඡේද වැඩසටහන් | | 6.00 | 6.00 |
| 3 | විශේෂ ව්‍යාපෘති (තුලිත ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය) | 50.00 | - | 50.00 |
| 4 | පුහුණු වැඩසටහන් | | 11.50 | 11.50 |
| 5 | ගිණුම් ක්‍රම සංවර්ධනය | | 8.00 | 8.00 |
| 6 | වාහන සඳහා කල් බදු ගෙවීම | | 189.00 | 189.00 |
| 7 | පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව | | 0.30 | 0.30 |
| 8 | රාජ්‍ය නිලධාරීන්ගේ නිල නිවාස අළුත්වැඩියාව /ඉදිකිරීම | | 30.00 | 30.00 |
| 9 | පසුගාමී හා හුදකලා ගම්මාන දියුණු කිරීම | 62.00 | - | 62.00 |
| 10 | හදිසි සංවර්ධනය | | 1.50 | 1.50 |
| 11 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | 4.00 | 4.00 |
| | **එකතුව** | **112.00** | **395.30** | **507.30** |

### ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

**මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස් බල, අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදා හැරීමේ කටයුතු හා ආයෝජන සම්බන්ධීකරණ පිළිබඳ අමාත්‍යංශය**

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩ සටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යාපන සංවර්ධන වැඩසටහන | | - | - |
| | ලෝක බැංකු ආධාර | 340.07 | - | 340.07 |
| | ඒකාබද්ධ අරමුදල | 144.00 | 1.00 | 145.00 |
| | මහනුවර බදුර්දීන් මහමුද් බාලිකා විද්‍යාලය සංවර්. (පකිස්ථාන් ආධාර) | 0.85 | - | 0.85 |
| | නැණෝදා වැඩසටහන | 52.00 | - | 52.00 |
| | පාසල් උපකරණ හා ලී බඩු අළුත්වැඩියාව | 5.00 | - | 5.00 |
| | පාසල් නිල නිවාස අළුත්වැඩියාව හා ඉදිකිරීම | 6.00 | - | 6.00 |
| 2 | ඉඩම් සංවර්ධන වැඩසටහන | 5.00 | - | 5.00 |
| 3 | ඉඩම් අත්පත් කරගැනීම | | 3.00 | 3.00 |
| 4 | මහවැලියෙන් පවරාගත් වත්කම් නඩත්තුව | 7.00 | - | 7.00 |
| 5 | පළාත් පාලන ආයතන සේවා | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමණාකරණය | 24.00 | - | 24.00 |
| | සතිපොළ සංවර්ධනය | 14.00 | - | 14.00 |
| | ප්‍රජා ජල සම්පාදනය | 14.00 | - | 14.00 |
| | ආදාහනාගාර ඉදි කිරීම | 15.00 | - | 15.00 |
| | පළාත් පාලන ආයතන වල ධාරිතා සංවර්ධනය | 1.00 | - | 1.00 |
| 6 | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 139.00 | - | 139.00 |
| 7 | පූර්ව ළමාවිය සංවර්ධනය | 5.00 | - | 5.00 |
| 8 | සංස්කෘතික සංවර්ධන වැඩසටහන | 4.00 | - | 4.00 |
| 9 | සංචාරක වෙළඳ හා වාණිජ කටයුතු | 32.00 | - | 32.00 |
| 10 | සමුපකාර සංවර්ධනය | 5.00 | - | 5.00 |
| 11 | සමුපකාර සේවක කොමිෂන් සභාව | - | 0.40 | 0.40 |
| 12 | වාහන මිලට ගැනීම | - | 16.00 | 16.00 |
| 13 | හදිසි සංවර්ධන කටයුතු | - | 1.50 | 1.50 |
| 14 | මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා වත්කම් අත්පත් කරගැනීම හා උපකරණ මිළදී ගැනීම | - | 11.00 | 11.00 |
| | **එකතුව** | **812.92** | **32.90** | **845.82** |

## ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

## සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යංශය

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | සෞඛ්‍ය සේවා | | | |
| | ලෝක බැංකු ආධාර | 355.00 | | 355.00 |
| | ඒකාබද්ධ අරමුදල | 190.00 | 1.00 | 191.00 |
| 3 | JICA මූලික සමාජ සංවර්ධන කටයුතු (රෝහල්) | 420.00 | - | 420.00 |
| 4 | මහනුවර සියා ආරෝග්‍යශාලාව සංවර්ධනය (පකිස්තාන් ආධාර) | 2.21 | - | 2.21 |
| 5 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 23.00 | 1.00 | 24.00 |
| 6 | පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු | 14.00 | | 14.00 |
| 7 | වාහන මිලට ගැනීම | | 7.00 | 7.00 |
| 8 | සමාජ සේවා කටයුතු | 12.00 | | 12.00 |
| 9 | හදිසි සංවර්ධන කටයුතු | | 1.50 | 1.50 |
| 10 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | 6.00 | 6.00 |
| | **එකතුව** | **1,016.21** | **16.50** | **1,032.71** |

## ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

## කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන, ධීවර, පරිසර කටයුතු, හින්දු සංසකෘතික හා වතු යටිතල පහසුකම් අමාත්‍යංශය

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | කෘෂිකර්ම සංවර්ධනය | 50.00 | 1.00 | 51.00 |
| 2 | කෘෂිමාර්ග සංවර්ධනය | 7.00 | | 7.00 |
| 3 | සුළු වාරිමාර්ග සංවර්ධනය | 24.00 | | 24.00 |
| 4 | සත්ව පාලන හා සෞඛ්‍ය කටයුතු | 32.00 | | 32.00 |
| 5 | මිරිදිය ධීවර | 7.00 | | 7.00 |
| 6 | පරිසර සංවර්ධන වැඩසටහන | 2.00 | 3.50 | 5.50 |
| 7 | හින්දු සංස්කෘතික | 1.00 | 1.00 | 2.00 |
| 8 | වතු මාර්ග සංවර්ධනය | 32.00 | | 32.00 |
| 9 | වාහන මිලට ගැනීම | | 7.00 | 7.00 |
| 10 | හදිසි සංවර්ධන කටයුතු | | 1.50 | 1.50 |
| 11 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | 1.00 | 1.00 |
| | **එකතුව** | **155.00** | **15.00** | **170.00** |

## ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

## මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | පළාත් මාර්ග සංවර්ධනය | 291.00 | | 291.00 |
| 2 | ග්‍රාමීය විකල්ප බලශක්ති සංවර්ධනය | 15.00 | | 15.00 |
| 3 | ප්‍රවාහන සංවර්ධනය | 24.00 | | 24.00 |
| 4 | නිවාස සංවර්ධන වැඩසටහන | 5.00 | | 5.00 |
| 5 | වාහන මිලට ගැනීම | | 7.00 | 7.00 |
| 6 | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (JICA) | 1,371.22 | | 1,371.22 |
| 7 | හදිසි සංවර්ධන කටයුතු | | 1.50 | 1.50 |
| 8 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | 1.00 | 1.00 |
| | **එකතුව** | **1,706.22** | **9.50** | **1,715.72** |

# ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2015

## ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය

රු.මිලියන

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | පළාත් නිශ්චිත | උපමාන පාදක | එකතුව |
|---|---|---|---|---|
| 1 | සුළු කර්මාන්ත සංවර්ධන, ව්‍යාපාර ප්‍රවර්ධන හා වෘත්තීය පුහුණුව | 16.00 | | 16.00 |
| 2 | තරුණ කටයුතු | 9.00 | | 9.00 |
| 3 | පේෂකර්ම සංවර්ධනය | 10.00 | | 10.00 |
| 4 | ක්‍රීඩා කටයුතු | 17.00 | | 17.00 |
| 5 | ග්‍රාම සංවර්ධන | 20.00 | | 20.00 |
| 6 | වනිතා කටයුතු | 5.00 | - | 5.00 |
| 7 | වාහන මිලට ගැනීම | | 7.00 | 7.00 |
| 8 | හදිසි සංවර්ධන කටයුතු | | 1.00 | 1.00 |
| 9 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | 2.00 | 2.00 |
| | **එකතුව** | **77.00** | **10.00** | **87.00** |